ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2013 ජනවාරි මස 03 වැනි දින |


## 2012 නොවැම්බර් මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය


පසුගිය මාස කිහිපය තුළ දී ආනයන වියදම පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ රත්‍රං, වාහන සහ ප්‍රවාහන උපකරණ ආදියෙහි ආනයන වියදම තවදුරටත් පහත වැටීම හේතුවෙන් 2012 වසරේ නොවැම්බර් මාසයේ ආනයන වියදම තවදුරටත් පහත වැටීමේ නැඹුරුවක් පෙන්වීය. ගෝලීය ආර්ථික තත්ත්වය තවදුරටත් පහත වැටීමත් සමඟ 2012 නොවැම්බර් මාසයේ අපනයන ආදායම ද පහත වැටීමක් වාර්තා විය. කෙසේවෙතත්, සෘතුමය ඉල්ලුම පිළිබිඹු කරමින් 2012 නොවැම්බර් මාසයේ දී ඇඟළුම්, තේ, මැණික් සහ ස්වර්ණාභරණ මෙන්ම හම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ සහ පාවහන් ආදියේ අපනයන ආදායම යහපත් වර්ධනයක් වාර්තා කර ඇත. මෙම වසරේ අප්‍රේල් මාසයේ සිට දිගින් දිගටම පහත වැටුණු ගෙවුම් ශේෂයෙහි වෙළෙඳ හිඟය මෙම වර්ධනයන් හේතුවෙන්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී 2012 වසරේ පළමු මාස එකොළහ තුළ දී පහත වැටීමක් වාර්තා කරන ලදී.

සියළුම ප්‍රධාන ආනයන කාණ්ඩයන් පහත වැටීම හේතුවෙන් ආනයන වියදම පහත වැටුණි. ආහාරමය සහ ආහාරමය නොවන කාණ්ඩයන්ගේ ආනයන වියදම අඩුවීම නිසා 2012 නොවැම්බර් මාසයේ දී, සමස්ත පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. එක්ව සැළකූ කල මුළු ආනයන වියදමෙන් තුනෙන් එකකට වඩා දායකත්වය ලබා දෙන ඉන්ධන සහ රෙදිපිළි ආනයන වියදම ඉහළ ගියද, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී, 2012 නොවැම්බර් මාසයේ අන්තර්භාණ්ඩ ආනයන වියදම සියයට 0.3

කින් සුළු වශයෙන් පහත වැටුණි. අන්තර්භාණ්ඩ අතුරින් රත්‍රං සහ පොහොර ආනයන වියදම පහත වැටීම, අන්තර්භාණ්ඩ ආනයන වියදම පහත වැටීම සඳහා මූලික වශයෙන් හේතු විය. මේ අතර, යන්ත්‍රසූත්‍ර හා උපකරණ මෙන්ම ප්‍රවාහන උපකරණ ආනයන වියදම පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙසින්, පෙර වසරේ අනුරූප කාලය සමඟ සැසඳීමේ දී 2012 නොවැම්බර් මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදමේ පහත වැටීමක් වාර්තා විය.

අපනයන සැළකීමේ දී, මෙම වසර තුළ දී තේ අපනයනය සඳහා සතුටුදායී මිලක් ලබාගත හැකි වූ අතර එබැවින්, මෙය අපනයන ආදායම වර්ධනය වීම සඳහා බෙහෙවින් උපකාරී විය. කෙසේවෙතත්, කෘෂිකාර්මික අපනයනයන් අතුරින් අනෙකුත් කාණ්ඩයන්ගේ අපනයන ආදායම පහත වැටීමත් සමඟ පෙර වසරේ අදාළ කාලය සමඟ සැලකීමේ දී 2012 නොවැම්බර් මාසයේ කෘෂිකාර්මික අපනයන ආදායමේ පහත වැටීමක් වාර්තා විය. පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී මෙම වසරේ මාර්තු මාසයේ සිට කාර්මික අපනයනයන්ගේ පහත වැටීමක් වාර්තා විය. කෙසේවෙතත්, නොවැම්බර් මාසයේ දී රෙදිපිළි ආනයනය ඉහළ වර්ධනයක් වාර්තා කිරීමත් සමඟ ඉදිරි මාස කිහිපය තුළ දී ද ඇඟළුම් අපනයනයේ යහපත් ක්‍රියාකාරිත්වයක් වාර්තා කිරීමට ඉඩ ඇති අතර, එය පසුගිය මාස කිහිපය තුළ දී අපනයන ආදායමේ දක්නට ලැබුණු පහත වැටීම අඩුකරලීම සඳහා උපකාරී වනු ඇත.




ගෙවුම් තුලනයේ සේවා ගිණුම සහ ජංගම සංක්‍රාම වෙත වූ ලැබීම් සලකා බැලීමේ දී සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තියන්ගේ ප්‍රේෂණ අඛණ්ඩව ඉහළ ගියේය. 2012 වසරේ නොවැම්බර් මාසයේ දී සංචාරක පැමිණීම් සංඛ්‍යාව 109,202 දක්වා සියයට 20.1 කින් ඉහළ ගිය අතර පළමු මාස එකොළහ තුළ දී 883,353 ක් දක්වා සියයට 16.5 කින් වර්ධනය විය. 2012 නොවැම්බර් මාසයේ දී සංචාරක ඉපැයීම් ද එ.ජ.ඩොලර් මිලියන 114.7 ක් දක්වා සියයට 30.1 කින් වර්ධනය විය. පළමු මාස එකොළහ තුළ දී සමුච්චිත සංචාරක ඉපැයීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 905.3 ක් දක්වා සියයට 23 කින් වර්ධනය

වීමක් ලෙස වාර්තා විය. නොවැම්බර් මස වාර්තා වූ ඉහළ සංචාරක ඉපැයීම් සහ 2012 දෙසැම්බර් මස දී එවැනිම ආදායමක් ලැබෙනු ඇතැයි යන අපේක්ෂාව මත 2011 දී වාර්තා වූ ඉපැයීම් අභිබවා 2012 වසරේ දී ඉහළ සංචාරක ඉපැයීම් ප්‍රමාණයක් සහ මිලයනයකට ආසන්න සංචාරක පැමිණීම් සංඛ්‍යාවක් වාර්තා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2012 නොවැම්බර් මාසයේ දී පසුගිය වසරේ නොවැම්බර් මාසය හා සැසඳීමේ දී සියයට 12.7 කින් වර්ධනය විය. 2012 වසරේ පළමු මාස එකොළහ තුළ දී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලයන 5,432 ක් දක්වා සියයට 17.1 කින් වර්ධනය විය. සංචාරක ඉපැයීම් සහ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මත වූ ඉහළ ලැබීම් හේතුවෙන් විදේශ විනිමය වෙළෙඳපොලෙහි ද්‍රවශීලතාවය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර එමඟින් රුපියලෙහි බාහිර අගය ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2012 වසරේ පළමු මාස එකොළහ තුළ දී, ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම වෙත විදේශ ව්‍යවහාර මුදල් සැලකිය යුතු ප්‍රමාණයක් ලැබිණි. 2012 නොවැම්බර් මස අවසානය වන විට කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ලැබුණු ශුද්ධ විදේශ ආයෝජන ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 280 ක් දක්වා ඉහළ ගිය අතර 2012 පළමු මාස එකොළහ තුළ දී රාජ්‍ය සුරැකුම්පත් හි විදේශීය ආයෝජන කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරමින්, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සඳහා වූ ශුද්ධ ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 833 ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, 2012 වසරේ පළමු මාස දහය තුළ දී රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 2,614 ක් විය. මීට අමතරව, 2012 වසරේ ජනවාරි - නොවැම්බර් කාලපරිච්ඡේදය තුළ දී වාණිජ බැංකුවල දිගුකාලීන ණය ගැනීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 973 ක් විය. ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි වූ සමාගම් වෙත ලැබුනු විදේශ ණය ඇතුළත් මුළු විදේශ සෘජු ආයෝජන ලැබීම් ප්‍රමාණය 2012 වසරේ පළමු මාස නවය තුළ දී එ.ජ.ඩොලර් මිලියන 615 ක් ලෙස වාර්තා වී ඇති අතර, වසරෙහි ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී තවදුරටත් විදේශ ආයෝජන ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2012 නොවැම්බර් මාසය අවසාන වන විට, දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 6,490 ක් වූ අතර, දළ නිල සංචිත සහ වාණිජ බැංකුවල විදේශීය වත්කම් ඇතුළත් මුළු විදේශීය සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 8,059 ක් විය. විදේශීය සංචිත ප්‍රමාණය ආනයනික මාස වශයෙන් සැලකූ විට, 2012 නොවැම්බර් මස අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 4.1 කට සමාන වන අතර, මුළු විදේශීය සංචිත ප්‍රමාණය ආනයනික මාස 5 කට සමාන විය.

# සංඛ්‍යා සටහන 1 - විදේශ අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් -නොවැම්බර් (අ)

| කාණ්ඩය | 2011 නොවැ. එ.ජ.ඩො. මිලියන | 2012 නොවැ. එ.ජ.ඩො. මිලියන | නොවැ. වර්ධනය (සියයට) | 2011 ජන. සිට නොවැ. එ.ජ.ඩො. මිලියන | 2012 ජන. සිට නොවැ. එ.ජ.ඩො. මිලියන | ජන. සිට නොවැ. වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | **885.8** | **827.6** | **-6.6** | **9,625.4** | **8,991.4** | **-6.6** |
| *මෙයින්* | | | | | | |
| **කෘෂිකාර්මික** | 206.7 | 190.2 | -8.0 | 2,316.6 | 2,114.1 | -8.7 |
| මෙයින්, | | | | | | |
| තේ | 125.2 | 126.0 | 0.6 | 1,357.9 | 1,273.6 | -6.2 |
| **කාර්මික** | 676.1 | 632.8 | -6.4 | 7,271.8 | 6,727.5 | -7.5 |
| මෙයින්, | | | | | | |
| රෙදිපිළි හා ඇඟළුම් | 347.7 | 363.9 | 4.6 | 3,809.1 | 3,633.3 | -4.6 |
| රබර් නිෂ්පාදන | 75.8 | 75.5 | -0.4 | 804.3 | 782.7 | -2.7 |
| ආහාර, පාන හා දුම්කොළ | 27.6 | 31.0 | 12.0 | 316.5 | 263.2 | -16.8 |
| **ඛනිජ ද්‍රව්‍ය** | 2.4 | 3.7 | 58.3 | 31.0 | 52.0 | 68.1 |
| ආනයන | **1,986.4** | **1,820.5** | **-8.4** | **18,393.0** | **17,574.3** | **-4.5** |
| *මෙයින්,* | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | 330.9 | 235.5 | -28.8 | 3,328.3 | 2,755.0 | -17.2 |
| *මෙයින්,* | | | | | | |
| ආහාර හා පාන වර්ග | 137.5 | 98.2 | -28.6 | 1,434.5 | 1,192.3 | -16.9 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 193.5 | 137.3 | -29.0 | 1,893.9 | 1,562.7 | -17.5 |
| **අන්තර් භාණ්ඩ** | 1,179.0 | 1,175.3 | -0.3 | 11,114.9 | 10,701.6 | -3.7 |
| *මෙයින්,* | | | | | | |
| ඛනිජ තෙල් | 489.6 | 581.3 | 18.7 | 4,306.1 | 4,672.5 | 8.5 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 193.2 | 204.0 | 5.6 | 2,118.8 | 2,072.6 | -2.2 |
| **ආයෝජන භාණ්ඩ** | 470.2 | 409.1 | -13.0 | 3,904.4 | 4,090.9 | 4.8 |
| *මෙයින්,* | | | | | | |
| යන්ත්‍රසූත්‍ර | 255.4 | 230.1 | -10.0 | 1,943.9 | 2,037.3 | 4.8 |
| ප්‍රවාහන උපකරණ | 124.2 | 55.8 | -55.0 | 969.6 | 933.9 | -3.7 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 90.2 | 122.9 | 36.2 | 987.4 | 1,115.7 | 13.0 |
| **වෙළෙඳ ශේෂය** | **-1,100.7** | **-992.9** | **-9.8** | **-8,767.6** | **-8,582.9** | **-2.1** |
| **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** | **436.0** | **491.2** | **12.7** | **4,638.7** | **5,432.0** | **17.1** |
| **විදේශීය සෘජු ආයෝජන (ආ)** | | | | **679.3** | **614.7** | **-9.4** |
| **විවිධ ආයෝජන (ශුද්ධ)** | **-3.4** | **11.8** | | **-157.0** | **280.3** | |
| **වාණිජ බැංකු විසින් ලබාගත් දිගුකාලීන විදේශ ණය** | | | | | **973.0** | |
| **සංචාරක ඉපැයීම්** | **88.2** | **114.7** | **30.1** | **735.7** | **905.3** | **23.0** |
| **රාජ්‍ය අංශයේ ලැබීම් (ඇ)** | **369.8** | **310.1** | **-16.1** | **3,761.7** | **4,834.9** | **28.5** |
| **මෙයින්,** | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 48.2 | 143.2 | 197.4 | 914.7 | 2,097.6 | 129.3 |
| දිගුකාලීන ණය | 281.4 | 153.5 | -45.5 | 2,701.2 | 2,613.7 | -3.2 |

(අ) තාවකාලික

(ආ) ආයෝජන මණ්ඩලයේ අනුමත සමාගම් ලද විදේශීය ණය ද ඇතුළුව, විදේශීය සෘජු ආයෝජන ලැබීම්, වසරේ පළමු මාස නවය සඳහා වාර්තා කරන ඇත.

(ඇ) රාජ්‍ය අංශයේ ලැබීම් ඔක්තෝබර් මාසය දක්වා පමණක් වසර දෙකෙහිම වාර්තාවී ඇති අතර, රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.